**ජාතික ආරක්ෂක අරමුදල - 2016**

**------------------------------------------**

ජාතික ආරක්ෂක අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 12 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදල් පනතේ 12(4) වගන්තියේ සඳහන් අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ මාගේ වාර්තාව පහත සඳහන් ඡේදයන්හි ඇතුළත් වන අතර ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය මෙහි ඇමුණුම 01 ලෙසද අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම් පිළිබඳ ප්‍රකාශනය ඇමුණුම 02 ලෙසද දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ආරක්ෂක අරමුදලේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

මූල්‍ය ප්‍රකාශනවල සටහන් විස්තරාත්මකව ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

අරමුදලට අයත් ඉඩම් හා ගොඩනැගිලි 2008 වර්ෂයේදී අවසන් වරට ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර ඒවායේ වටිනාකම පිළිවෙලින් රු.11,030,000 ක් හා රු.4,520,000 ක් ලෙස 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබුණු ආයෝජන අගය රු.918,384,284 ක් වුවද ඊට අදාළව ජාතික ඉතිරිකිරීමේ බැංකුව මගින් නිකුත්කළ තැන්පතු අලුත්කිරීමේ වාර්තා අනුව එම වටිනාකම රු.918,114,310 ක් වූයෙන් රු. 269,974 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ රු. 65,662,079 ක් වූ ආයෝජන පොළී ආදායම සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවූ අතර ස්ථාවර තැන්පතු සහතික අනුව එම ආදායම රු. 62,665,692 ක් වූයෙන් රු.2,996,387 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.66,662,514 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.48,440,571 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 18,221,943 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළදී ආයෝජන පොළී ආදායම රු.11,491,428 කින් වැඩිවීම හා සුභසාධක වියදම රු.6,186,354 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ හතරක අරමුදලේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2012 වර්ෂයේ රු.57,510,513 ක් වූ අතිරික්තය 2013 වර්ෂය වන විට රු.80,680,937 ක් දක්වා වර්ධනය වී තිබුණි. එහෙත් 2014 හා 2015 වර්ෂවලදී එම අතිරික්තය ක්‍රමයෙන් පිරිහී 2015 වර්ෂය අවසානයට රු.48,440,571 ක්වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී නැවතත් එය රු.66,662,514 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු අරමුදලේ දායකත්වය 2012 වර්ෂයේදී රු. 57,714,991 ක් වී තිබුණු අතර 2013 වර්ෂයේදී රු.80,884,212 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වෙතත්, එම දායකත්වය 2014 හා 2015 වර්ෂවලදී ක්‍රමයෙන් පිරිහී 2015 වර්ෂයේදී රු.48,625,395 ක් වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී නැවත රු.66,836,447 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

-------------------

1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව, රාජකාරී කටයුතු ඉටුකරන අතරතුර දී තුවාල ලද හෝ මියගිය පොලිස් බලකායේ හෝ සන්නද්ධ හමුදාවල හෝ යම් සාමාජිකයෙකුගේ පවුල්වලට ප්‍රතිලාභ ගෙවීම ඇතුළුව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීමට වඩාත්ම හේතුවන්නේ යයි අරමුදලේ පාලක මණ්ඩලය අදහස් කරන ආකාරයට සහ අරමුදලට අයත් මුදල් ජනාධිපතිවරයාගේ විධිවිධානවලට යටත්ව යොදාගැනීම, අරමුදලේ පාලක මණ්ඩලයේ කාර්යය වී තිබුණි.

විගණනයට ලැබී ඇති තොරතුරු අනුව, යුද්ධයෙන් මියගිය හා අතුරුදහන් වූ ත්‍රිවිධ හමුදාවට අයත් සාමාජික සංඛ්‍යාව 25,273 ක් හා ආබාධිත රණවිරුවන් සංඛ්‍යාව 18,942 ක් වූ අතර අරමුදල විසින් ඔවුන්ගේ සුභසාධනය සඳහා සිදු කර තිබුණු කාර්යයන් වූයේ 5 වසරේ ශිෂ්‍යත්වය සමත් දරුවන් සඳහා ඉතුරුම් තැන්පත් ලබාදීම හා එක් රණවිරුවකු වෙනුවෙන් ඉතුරුම් තැන්පත් පොළී මුදල් ලබාදීම පමණක් විය. සමාලෝචිත වර්ෂය තුළදී ශිෂ්‍යත්වය සමත් දරුවන් සඳහා වූ මූල්‍ය අනුග්‍රහය දක්වන වැඩ සටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) යුද්ධ හමුදාවේ පරිහරණය සඳහා කුලියට ලබාදී තිබුණු අරමුදල සතු නිවාස 03ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට අය කර ගත යුතු හිඟ නිවාස කුලී මුදල රු. 1,921,500 ක් විය. ඉන් රු.721,500 ක් වර්ෂ දෙකකට වැඩි කාලයක සිට හිඟව පැවති අතර එම මුදල අයකර ගැනීමට ඵලදායී ක්‍රියාර්මාර්ග ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දී තිබුණු නමුත් යුධ හමුදාව සමග කුලී ගිවිසුමක් ඇති කරගැනීමට සමාලෝචිත වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) ජාතික ආරක්ෂක අරමුදල වෙත 1987 වර්ෂයේදී පරිත්‍යාගයක් ලෙස ලැබී, ජනාධිපති ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබෙන පිරමීඩාකාර වීදුරු ආවරණයකින් සමන්විත මැණික් ඔබ්බවන ලද ඔටු රූපයේ ඇතුළත් මැණික්, ස්වභාවික ගල් වශයෙන් නිශ්චිතව තහවුරු කර ගැනීමට නොහැකිව තිබුණු නමුත්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සමීක්ෂණ මණ්ඩලයක් මගින් ස්වභාවික ගල් ලෙස සලකා එහි වටිනාකම රු.2,890,415 ක් ලෙස තක්සේරු කර තිබුණි. එම ඔටු රූපයේ වටිනාකම නිවැරදිව තක්සේරු කිරීම සඳහා අනුගමනය කලයුතු ක්‍රම වේදයේ පැවති ගැටලු සහගත තත්වය මත මෙලෙස තක්සේරු වාර්තාවක් ලබා දීමට සිදුවූ බව අරමුදලේ ලේකම් විසින් දන්වා තිබුණි.

(ඇ) අරමුදල පිහිට වූ දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පාලක මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි. පාලක මණ්ඩලයේ සාමාජිකයන්ට රැස්වීමට පැවැති ප්‍රායෝගික දුෂ්කරතා සැලකිල්ලට ගෙන එම සංයුතිය වෙනස් කිරීම සඳහා 1991 අංක 10 දරන පනතින් සංශෝධිත 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 3(2) වගන්තිය සංශෝධනය කිරීමට 2016 අගෝස්තු 16 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුනද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම කටයුතු අවසන් කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ්/ 423 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 ජුනි 09 දින ඉදිරිපත් කර තිබුණි.

(අ) 1991 අංක 10 දරන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධිත) පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ අරමුදලේ නිළධාරීන් දෙදෙනෙකුගේ අත්සන් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අයවැය ලේඛනය

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 (ඇ) වගන්තිය අනුව, අනුමත කරන ලද අයවැය ලේඛනයකින් තොරව අදාළ මුදල් වර්ෂයේදී කිසිදු වියදමක් නොදැරිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල විසින් අයවැය ලේඛනයක් පිළියෙල කරගෙන අනුමත කර නොතිබුණි.

### 5.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදයේ දැක්වෙන පරිදි අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේ ආරක්ෂක අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සැලස්ම යටතේ අමාත්‍යාංශයට අයත් අරමුදල් සඳහා අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීමට සැලසුම් කර තිබුනු නමුත් සිදුකරන ලද අභ්‍යන්තර විගණනයන් සම්බන්ධ වාර්තා වල පිටපත් මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර අරමුදලේ කළමනාකරණයේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ආයෝජන වටිනාකම නිවැරදිව හඳුනා නොගැනීම, ආයෝජන පොලී ආදායම් උප ලේඛණ පිළියෙල නොකිරීම. |
| (ආ) | මෙහෙයුම් කළමනාකරණය | කුලී ගිවිසුම් වලට එළඹ නොතිබීම, වත්කම් ප්‍රත්‍යාගණන නොකිරීම, පාලක මණ්ඩල රැස්වීම් නොපැවැත්වීම. |
| (ඇ) | මෙහෙයුම් පාලනය | පනතේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු නොකිරීම. |

ඇමුණුම **:01**

**ජාතික ආරක්ෂක අරමුදල 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය**

| | 2016 | 2015 |
|---|---:|---:|
| | රු. | රු. |
| **ආදායම්** | | |
| පරිත්‍යාග | 2,520 | 5,950 |
| ආයෝජන පොළී | 65,662,079 | 54,170,651 |
| ගෙවල් කුලී | 1,200,000 | 666,000 |
| | 66,864,599 | 54,842,601 |
| **වියදම්** | | |
| කාර්ය මණ්ඩල දීමනා | 17,400 | 20,400 |
| සුභ සාධක වියදම් | 28,152 | 6,214,506 |
| ස්ථාවර වත්කම් ක්ෂය | 156,533 | 164,424 |
| බැංකු ගාස්තු | - | 2,700 |
| | 202,085 | 6,402,030 |
| වියදමට වැඩි ආදායම | 66,662,514 | 48,440,571 |

ඇමුණුම :02

**ජාතික ආරක්ෂක අරමුදල 2016 වර්ෂයේ මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශය**

| ගිණුම් අංකය | ආයෝජනය කරන ලද ආයතනය | ආයෝජන වර්ගය | ආයෝජන දිනය | කාලසීමාව | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| | | | | අවු: | රු. |
| 2 0065 11 75912 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 ජුනි 30 | 1 | 12,327,034 |
| 2 0065 11 75939 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 ජුනි 30 | 1 | 15,861,117 |
| 2 0065 11 75823 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 ජුලි 07 | 1 | 139,948,273 |
| 2 0065 11 78202 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 සැප්: 25 | 1 | 246,329 |
| 2 0065 11 78148 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 සැප්: 25 | 1 | 122,728,616 |
| 2 0065 11 86302 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 ජුලි 22 | 1 | 1,009,782 |
| 2 0065 11 95603 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 අප්‍රේල් 09 | 1 | 12,236,260 |
| 2 0065 11 73189 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 මාර්තු 24 | 1 | 84,222,845 |
| 2 0065 11 75807 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 ජුනි 27 | 1 | 104,715,785 |
| 2 0065 11 75815 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 ජුනි 27 | 1 | 119,174,180 |
| 2 0065 11 83940 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 අප්‍රේල් 29 | 1 | 60,662,295 |
| 2 0001 2248549 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 ජනවාරි 07 | 1 | 1,400,000 |
| 2 0001 22 29927 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 අගෝ: 28 | 1 | 149,807,802 |
| 2 00651025058 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතු | 2016 මාර්තු 31 | 1 | 400,000 |
| LKA36417G140 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | භාණ්ඩාගාර බිල්පත් | 2016 ජුලි 15 | 1 | 93,643,967 |
| | | | | | 918,384,285 |